## කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2013/14
2017 අප්‍රේල් - ජූනි
මානවශාස්ත්‍ර පීඨය

**සිංහල - SINH – E 2015**

සිංහල ගද්‍ය සාහිත්‍යය, නාට්‍ය හා සිනමාව

එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් වත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

### I – කොටස

01. පහත සඳහන් ඡේදයෙහි අවස්ථා සම්බන්ධය පැහැදිලි කොට එහි ලා උපයුක්ත රචනා රීතියේ විශේෂතා පිළිබඳ අගැයීමක් කරන්න.

කල් ගිය සේ තවත් බඩ දරු කෙනෙක් ඇති වූ ය. දෙවන වරෙහි ද වදන අවස්ථාවෙහි දී දෙමවුපියන් ළඟට කැඳවාගෙන යන්ට පැරැත්ත කියාපියා උන් නො ගිවිස්නා හෙයින් ආදී උපන් දරුවන් පයින් යන්ට අබල හෙයින් උනුත් වඩාගෙන බඩ දරුවනුත් බඩින් හැර ගෙන නික්මුණාහ. සමුණන් ලුහුබඳවාගෙන ගොසින් රඳවන්ට උත්සාහ කොටත් නොරඳා නික්මුණ වූය.සමුණෝත් කැටි ව නික්මුණවූය. මෙසේ එක් ව යන කලට නො කල් නො වේලා කොට ලා මහ වැස්සෙක් නැඟීය.ඒ වේලාට ගසන විදුලියෙන් හා මේඝනාදයෙන් හා වස්නා වැස්සෙන් ආකාශය අතුරු සිදුරු නැති වීය. ඒ වේලාට ම පිට පිට හෙළා විදුලිය ගසන්නා සේ විළිත් පහරනට වන. ආස ගුගුරන්නා සේ හඬ ගසන්ටත් වන. වස්නා වැසි බෝවා සේ ම ප්‍රසව දුකුත් බෝ විය. සමුණන් බණවා ලා 'විළිත් පරනට වන. ශීත පීඩා බලවත් හෙයින් ඇල් වැද පියා විළිත් ලාගත නො හෙමි. නොතෙමී වදාපියන තැනක් ඉදිකරව' යි කිවූය.

02. පැරණි සිංහල ගද්‍ය සාහිත්‍යය අධ්‍යයනයෙහි ලා **පොළොන්නරු යුගයෙන්** ලැබෙන පිටිවහල කෙබඳු වූවක් දැ යි සනිදර්ශන ව පැහැදිලි කරන්න.

03. නිරූපණ ශෛලියට ප්‍රමුඛත්වය දී රචනා කළ **බුත්සරණින්** ප්‍රකට වන අපූර්වත්වය පිළිබඳ ඇගයීමක් කරන්න.

**නැතහොත්**

"**සද්ධර්මරත්නාවලියෙන්** පළට වන්නේ මිනිසාගේ භෞතික හා අධ්‍යාත්මික ජීවිතය පිළිබඳ ධර්මසේන හිමියන් සතු වූ සානුකම්පිත මානවහිතවාදී දෘෂ්ටියයි." නියමිත කථාවස්තු ඇසුරින් විභාග කරන්න.

## II – කොටස

04. ලෙනාඩ් වුල්ෆ් විදේශිකයකු වුව ද මෙරට ගැමි ජනජීවිතය ඉසියුම් ලෙස විනිවිද දුටු අයුරු **බැද්දේගම** නවකථාවෙන් නිරූපණය වන ආකාරය පැහැදිලි කරන්න.

05. "චරිත නිරූපණයෙහි ලා කතුවරයා දැක් වූ සුවිශේෂ කුසලතාව **විලාසිනියකගේ ප්‍රේමය** නවකථාවේ සාර්ථකත්වයට බල පෑ ප්‍රධාන හේතුවයි." විමසන්න.

06. සිංහල කෙටිකතාව පෝෂණය කිරීමෙහි ලා මධුරසිංහ ගුණතිලක දැක්වූ දායකත්වය කෙබඳු වූවක් දැයි **තාපපටලය** කෙටිකතා සංග්‍රහය ඇසුරින් පරීක්ෂා කරන්න.

**නැතහොත්**

පහත සඳහන් කෙටිකතා අතරින් එකක් පිළිබඳ විචාරාත්මක ඇගයීමක් කරන්න.

i. නෘත්‍යාගාරය
ii. උරුමකරුමය
iii. පටුතීරය
iv. කඳු වළල්ලෙන් එහා

## III – කොටස

07. සාම්ප්‍රදායික දේශීය නාට්‍ය කලාවෙන් හඳුනාගත හැකි පැරණි අභිචාරාත්මක ලක්ෂණ **සොකරි** හා **කෝලම්** නාට්‍ය ඇසුරින් පරීක්ෂා කරන්න.

08. ඓතිහාසික පුරාවෘත්තයක් උසස් නාට්‍යයක් ලෙස ප්‍රතිනිර්මාණය කිරීමෙහි ලා එදිරිවීර සරත්චන්ද්‍ර දැක් වූ කුසලතාව **සිංහබාහු** නාට්‍ය ඇසුරින් සාකච්ඡා කරන්න.

09. "සමකාලීන සමාජ හා දේශපාලන යථාර්ථය ඊස්කිලස්ගේ **ප්‍රොමිතියස් බන්ධන** නාට්‍යයට වස්තු විෂය විය." මෙහි සත්‍යාසත්‍යතාව පරීක්ෂා කරන්න.

10. **රෂෝමොන්** චිත්‍රපටයේ සිනමාරූපී ගුණය පිළිබඳ විග්‍රහයක් කරන්න.

**නැතහොත්**

"**තුංමංහංදිය**" සිංහල සිනමාවට දේශජ ගතිලක්ෂණ එක් කළ නිර්මාණයකි." අදහස් දක්වන්න.

(සෑම පිළිතුරකටම ලකුණු 20 බැගිනි)

**********************